ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

தேசிய போக்குவரத்து மருத்துவ நிறுவகம்

National Transport Medical Institute

2022

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT

පටුන

	පිටු අංකය
හැඳින්වීම	1
දැක්ම	1
මෙහෙවර	1
පරමාර්ථ	1
ආයතනයේ ප්‍රධාන කාර්යයන්	1
සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය	2
විගණන හා කළමනාකරණ කමිටුව	2
ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය	3
ආයතනික තොරතුරු	3
සභාපතිතුමාගේ පණිවුඩය	5
2022 වර්ෂයේ කාර්ය සාධනය	7-16
විගණකාධිපති වාර්තාව	17-24
විගණන විමසුම සඳහා ගත් ක්‍රියාමාර්ග	25-26
2022 වර්ෂයේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග	27
අවසන් ගිණුම් වාර්තාව	
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	28
මූල්‍ය කාර්යසාධන වාර්තාව	29
හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය	30
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	31
ගණකාධිකරණ ප්‍රතිපත්ති හා ගිණුම් සඳහා සටහන්	32-47
සත්‍යය සහ අයවැයගත සැසඳුම් ප්‍රකාශය	48-51
ශාඛා කාර්යාල ලාභය	52

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

1. හැඳින්වීම

සීමාසහිත සවුත් වෙස්ටර්න් බස් සමාගමට අයත්ව, එහි සේවක සේවිකාවන් හට වෛද්‍ය පහසුකම් සැපයීම සඳහා වෛද්‍ය මධ්‍යස්ථානයක් ලෙස රත්මලාන ඩිපෝ පරිශ්‍රයේ පිහිටුවා තිබූ මෙම ආයතනය 1958 බස් සමාගම් ජනසතු කිරීමත් සමඟ ම ලංකා ගමනාගමන මණ්ඩලය සතු විය. බස් ජන සතුවෙන් පසුව "ලංගම වෛද්‍ය කොට්ඨාශය" නමින් මෙය හඳුන්වන ලදී.

සේවා පුළුල් කිරීමේ අරමුණින් රත්මලාන ඩිපෝ පරිශ්‍රය තුළ පිහිටුවා තිබූ වෛද්‍ය මධ්‍යස්ථානය, 1970 වර්ෂයේදී ලංගමය සතුව තිබූ නුගේගොඩ, හයිලෙවල් පාර, අංක : 170 දරණ ස්ථානයට ගෙන එන ලද අතර, වර්තමානයේ "ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය" යන නමින් ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ස්වයං ආදායම් උත්පාදන රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වේ.

1997 අංක 25 දරණ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත මගින් ස්ථාපිත කර ඇත. ආයතනයේ මූලික අරමුණු ඉටුකර ගැනීම උදෙසා, 1999 නුගේගොඩ ප්‍රධාන කාර්යාලයෙන් ආරම්භ වී මේ වන විට දිස්ත්‍රික්ක විසිපහ තුළම ව්‍යාප්ත වී ඇති ශාඛා කාර්යාල ජාලයකින් සමන්විත වේ.

2. දැක්ම

"සෑම සුක්කානමක් පිටුපසම නිරෝගීමත් රියදුරකු හිඳුවීම."

3. මෙහෙවර

"ශ්‍රී ලංකාව තුළ ප්‍රවාහන වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වෙමින් සියලුම රියදුරු බලපත්‍ර අපේක්ෂකයන්ට අධ්‍යාත්මික හා ගුණාත්මක වෛද්‍ය පරීක්ෂණ සිදුකර ශාරීරික හා මානසික යෝග්‍යතාවය පිළිබඳ සහතික කිරීම."

4. පරමාර්ථ

- සියලු ම රියදුරු බලපත්‍ර අයදුම්කරුවන්ගේ ශාරීරික සහ මානසික යෝග්‍යතාවය පරීක්ෂා කර බැලීම.
- නිකුත් කරනු ලබන වෛද්‍ය සහතිකයේ ගුණාත්මක බව හා ආරක්ෂක උපක්‍රම වර්ධනය කිරීම.
- මනා මානව සම්පත් කළමනාකරණය තුළින් සේවාවේ ගුණාත්මක බව ළඟා කර ගැනීම.

5. ආයතනයේ ප්‍රධාන කාර්යයන්

බර වාහන රියදුරන්, සැහැල්ලු වාහන රියදුරන්, රියදුරු පාසැල්වලින් පුහුණුව ආරම්භ කිරීමට අපේක්ෂිත සියලු දෙනා, ගරු අධිකරණය, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ඇතුළු වෙනත් බාහිර ආයතන මගින් යොමුකරන රියදුරන්ගේ වෛද්‍ය පරීක්ෂණ සිදුකර ඔවුන්ගේ යෝග්‍යතාවය සහතික කොට වෛද්‍ය සහතික නිකුත් කිරීම මෙම ආයතනයේ ප්‍රධාන කාර්යය වන්නේය.

සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී	-	වෛද්‍ය එස්.ඒ.කේ. ගමගේ මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්	-	වී.පී.සී.ආර්. අබේගුණවර්ධන මහත්මිය ශෂී වෙල්ගම මහතා (2022.05.26 දක්වා) වෛද්‍ය එච්.එච්.පී. ක්‍රිශාන්ත මහතා (2022.10.28 සිට) පී.වී.බී.පී. සිසිර නන්දන මහතා (2022.09.22 සිට) ඉන්දික හපුගොඩ මහතා (2021.07.16 දින සිට) පී.ඩබ්.සී.එල්. පනාපිටිය මහතා වෛද්‍ය එස්.කේ.පී. තරංග මහතා (2022.10.17 දක්වා) වෛද්‍ය ප්‍රසාද් රණවීර මහතා (2022.10.17 දක්වා) වෛද්‍ය ජී.එන්. ෆොන්සේකා මිය (2022.08.10 සිට) නිලාන් මිරැන්ඩා මහතා (2022.05.26 සිට) එම්.ඒ.කේ.ඩී. ගමගේ මිය (2022.09.01 දක්වා) සුනිල් පුංචිහේවා මහතා (2022.10.17 දක්වා)
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	-	කේ.ජී.අයි.එස්. පෙරේරා මහත්මිය (2022.03.21 දක්වා) එච්.එම්.කේ.සී. හේරත් මිය (2022.03.22 සිට)
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	-	සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩල රැස්වීම් එකොළහක් පැවැත්විණි.

විගණන හා කළමණාකරණ කමිටු

විගණන හා කළමණාකරණ කමිටු සාමාජිකයන් -

සභාපති	-	පී.වී.බී.පී. සිසිර නන්දන මහතා එම්.ඒ.කේ.ඩී. ගමගේ මිය (2022.03.30 දක්වා)
සාමාජික	-	වී.පී.සී.ආර්. අබේගුණවර්ධන මහත්මිය
සාමාජික	-	නිලාන් මිරැන්ඩා මහතා
නිරීක්ෂක	-	ඩම්.එම්.එස්.පී. විජේරත්න මිය
නිරීක්ෂක	-	පී.කේ.එම්.ඩී. ගුණසේන මහතා
අධ්‍යක්ෂක (පරිපාලන/මූල්‍ය)	-	ටී.ජී. ලක්ෂ්මන් මහතා
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	-	වෛද්‍ය කේ.එස්.එම්. සමරසේකර මිය
ගණකාධිකාරී	-	එස්.පී.ඒ.එස්. දිසානායක මහතා
අභ්‍යන්තර විගණක	-	එල්.එම් ජයලත් මහතා
අධ්‍යක්ෂක (පරිපාලන)	-	එම්.ඩී.සී.ඩී. පෙරේරා මහතා
පරිපාලන නිලධාරී	-	එච්.එච්.ආර්.කේ. හේරත් මිය
ලේකම්	-	එච්.එම්.සී.කේ. හේරත් මිය

විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් - සමාලෝචිත වර්ෂය තුළ කමිටු රැස්වීම් හතරක් පැවැත්විණි.

ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

අධ්‍යක්ෂක (පරිපාලන/මූල්‍ය)	-	ටී.ජී. ලක්ෂ්මන් මහතා
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	-	වෛද්‍ය කේ.එස්.එම්. සමරසේකර මිය
ගණකාධිකාරී	-	එස්.පී.ඒ.එස්. දිසානායක මහතා
අභ්‍යන්තර විගණක	-	එල්.එම්. ජයලත් මහතා
නීති නිලධාරී/ අධ්‍යක්ෂක මණ්ඩල ලේකම්	-	එච්.එම්.සී.කේ. හේරත් මිය
අධ්‍යක්ෂක (පරිපාලන)	-	එම්.ඩී.සී.ඩී. පෙරේරා මහතා
පරිපාලන නිලධාරී	-	එච්.එච්.ආර්.කේ. හේරත් මිය

ආයතනික තොරතුරු

ආයතනයේ ලියාපදිංචි කාර්යාලීය දුරකථන අංකය	-	0112-812796
කාර්යාලීය ෆැක්ස් අංකය	-	0112-812795
කාර්යාලීය ඊමේල් ලිපිනය	-	ntmi@sltnet.lk
කාර්යාලීය වෙබ් ලිපිනය	-	www.ntmi.lk

සභාපතිතුමාගේ පණිවුඩය

රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් 1997 අංක 25 දරණ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත අනුව ක්‍රියාත්මක වන මෙම ආයතනයේ මූලික අරමුණු වන්නේ ශ්‍රී ලංකාව තුළ සිටින බරවාහන, සැහැල්ලු වාහන, රියදුරු පාසැල්වලින් පුහුණුව ආරම්භ කිරීමට අපේක්ෂිත සියලු දෙනාගේ, ගරු අධිකරණය, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ඇතුළු වෙනත් බාහිර ආයතන මඟින් යොමුකරන රියදුරන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව උසස් හා ගුණාත්මක වෛද්‍ය පරීක්ෂණයක් සිදුකර ඔවුන්ගේ යෝග්‍යතාවය සහතික කොට වෛද්‍ය සහතික නිකුත් කිරීමයි. මේ සඳහා ප්‍රධාන කාර්යාලය හා ශාඛා කාර්යාල 25ක් දිවයින පුරා පිහිටුවා ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ සිටින සියලුම රියදුරන්ගේ සෞඛ්‍ය තත්ත්වය යහපත් මට්ටමකින් පවත්වාගෙන යාමට ක්‍රියා කරන අතරම, සේවාලාභීන්ට සපයනු ලබන සේවාවේ ගුණාත්මක බව ඉහළ නැංවීමටත්, සේවක මණ්ඩලයේ ප්‍රගතිය හා ඔවුන් තුළ ධනාත්මක ආකල්ප ඇති කිරීමටත්, ආයතනික පරමාර්ථ කරා ළඟාවීමට අවශ්‍ය උපායක්‍රමික සැලසුම් අනුගමනය කිරීම තුළින් සපයනු ලබන සේවාවේ ගුණාත්මක වෙනසක් ඇති කළෙමි.

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සභාපතිවරයා වශයෙන් මෙම ආයතනයට පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂය තුළ සිදු වී ඇති ප්‍රගතියට දායකත්වය ලබා දී ඇති එම වර්ෂයේ සිටි අධ්‍යක්ෂ මණ්ඩලය, ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ අනෙකුත් කාර්ය මණ්ඩලයට ස්තුති පූර්වක වන අතරම, ආයතනයේ සභාපතිවරයා වශයෙන් තවදුරටත් මෙම ආයතනය මගින් සේවාදායකයන්ට කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබාදීම කෙරෙහි අවධානය යොමු කරවමි.

වෛද්‍ය සවින්ද්‍ර ගමගේ

සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී
ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

2022 වර්ෂයේ කාර්ය සාධනය

2022 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය දක්වා රියැදුරු බලපත්‍ර අපේක්ෂකයින්ගේ වෛද්‍ය පරීක්ෂණ සිදුකොට වෛද්‍ය සහතික නිකුත් කිරීම පිළිබඳ විග්‍රහයක් පහත දක්වා ඇත.


2022 දෙසැම්බර් මස 31 දින දක්වා

ශාඛාව	සිදුකරන ලද මුළු වෛද්‍ය පරීක්ෂණ සංඛ්‍යාව	සෞඛ්‍යය හේතූන් මත වෛද්‍ය පරීක්ෂණය තාවකාලිකව අසමත් වූ රියදුරන් හා රියදුරු බලපත්‍ර අපේක්ෂකයින් සංඛ්‍යාව	තාවකාලිකව අසමත් වූ රියදුරන් හා රියදුරු බලපත්‍ර අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය
ප්‍රධාන කාර්යාලය	118,105	7,472	6.33%
වේරහැර	75,400	7,251	9.62%
ගම්පහ	69,230	5,039	7.28%
කළුතර	37,419	2,098	5.61%
නුවර	52,664	3,887	7.38%
මාතර	28,573	1,558	5.45%
ගාල්ල	35,926	3,008	8.37%
හම්බන්තොට	34,170	2,051	6.00%
කුරුණෑගල	74,492	5,304	7.12%
අනුරාධපුර	37,784	1,929	5.11%
රත්නපුර	25,835	1,161	4.49%
බදුල්ල	21,529	1,376	6.39%
මොණරාගල	17,456	1,457	8.35%
යාපනය	25,810	1,222	4.73%
මන්නාරම	4,498	307	6.83%
වවුනියාව	10,486	571	5.45%

කිලිනොච්චිය	7,774	352	4.53%
මඩකලපුව	23,100	1,172	5.07%
ත්‍රිකුණාමලය	17,337	1,447	8.35%
අම්පාර	21,187	1,794	8.47%
මාතලේ	19,922	1,276	6.40%
කෑගල්ල	25,822	2,017	7.81%
මුලතිව්	4,066	393	9.67%
නුවරඑළිය	14,522	971	6.69%
පොළොන්නරුව	16,956	1,693	9.98%
පුත්තලම	27,243	1,835	6.74%
එකතුව	847,306	58,641	6.92%

2022 දෙසැම්බර් මස 31 දක්වා සිදු කරන ලද මුළු වෛද්‍ය පරීක්ෂණ සංඛ්‍යාව 847,306ක් වේ. එමඟින් 2022 දෙසැම්බර් මස 31 දක්වා සෞඛ්‍යමය හේතූන් මත රියදුරු වෘත්තියේ යෙදවීමට නුසුදුසු බවට වෛද්‍යවරුන් විසින් නිගමනය කර ඇති ප්‍රමාණය 6.92%ක් වේ. එනම් පරීක්ෂණ සඳහා ඉදිරිපත් වූ සෑම අපේක්ෂකයන් 100 දෙනෙකුගෙන් 6-7% ත් අතර සංඛ්‍යාවක් සෞඛ්‍යමය හේතූන් මත රිය පැදවීමට නුසුදුසු බවට තහවුරු වී ඇත.

වෛද්‍ය පරීක්ෂණ සිදු කිරීමේදී හඳුනාගත් රෝගාබාධ පහත සඳහන් පරිදි වේ.




හඳුනාගත් රෝගාබාධවලින් වැඩි ප්‍රතිශතයකට හේතුව ඇස් පෙනීමේ දුර්වලතාවය නිසා බව ඉහත ප්‍රස්ථාරයෙන් පැහැදිලි වේ.

2022 වර්ෂයේදී පොලිස් දෙපාර්තමේන්තුවෙන් හා ගරු අධිකරණය මඟින් විවිධ වැරදි නිසා වෛද්‍ය පරීක්ෂණ කිරීමේ අවශ්‍යතාවය මත යොමුකරන ලද රියදුරන්ගෙන් 6% - 7% අතර ප්‍රතිශතයක් රිය පැදවීම සඳහා සුදුසු ශාරීරික හෝ මානසික යෝග්‍යතාවයකින් යුක්ත නොවන බවට හඳුනා ගෙන ඇත. ඒ අනුව, සෞඛ්‍යමය වශයෙන් රියදුරන් රිය ධාවනය කිරීමට නුසුදුසු බවට සහතික කිරීම මඟින් මාර්ග අනතුරු අවම කිරීමට අප ආයතනය සෘජුවම දායක වී ඇත.

2022 දෙසැම්බර් 31 දින දක්වා			2021 දෙසැම්බර් 31 දින දක්වා		
සේවාලාභීන් සංඛ්‍යාව	වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිටින අවස්ථාවේදී අසමත් සංඛ්‍යාව	අසමත් සේවාලාභීන්ගේ ප්‍රතිශතය %	සේවාලාභීන් සංඛ්‍යාව	වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිටින අවස්ථාවේදී අසමත් සංඛ්‍යාව	අසමත් සේවාලාභීන්ගේ ප්‍රතිශතය %
3,989	250	6.27	3,152	139	4.41

වෛද්‍ය සහතික නිකුත් කිරීමේ ප්‍රගතිය

2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සිදු කළ වෛද්‍ය පරීක්ෂණ ප්‍රමාණය ප්‍රස්තාර සටහනකින් පහත දැක්වෙන අතර 'කොවිඩ් - 19' වසංගත තත්ත්වය තුළ වුවද 2019 වර්ෂයට සාපේක්ෂව 2020 හා 2021 වර්ෂයන්හිද වෛද්‍ය පරීක්ෂණවල සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන අතර 2022 වර්ෂයෙහි රටෙහි පැවති ගැටළුකාරී තත්ත්වය මත වුවද වෛද්‍ය පරීක්ෂණ 847,306ක ප්‍රමාණයක් සිදු කර ඇත.



ව්‍යාපෘති සහ වැඩසටහන්වල ප්‍රගතිය

- පහසුකම් පුළුල් කිරීමේ ව්‍යාපෘතිය හා පහසුකම් පුලුල් කළ නොහැකි ගොඩනැගිලි ඇති ශාඛාවල ඒ වෙනුවට නව ස්ථාන ලබා දීමේ ව්‍යාපෘතිය.


  මේ යටතේ සේවාලාභීන්හට කාර්යක්ෂම හා තෘප්තිමත් සේවාවක් ලබා දීමේ අරමුණෙන් පහත සඳහන් ව්‍යාපෘති සිදුකර ඇත.

- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ කළුතර ශාඛාව 2022.03.15 දින වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම.





- මාසික කුලී පදනම මත තෝරා ගත් ත්‍රිකුණාමලය ශාඛා කාර්යාලයේ අභ්‍යන්තර ව්‍යුහය වෙනස් කර නවීකරණ කටයුතු සිදු කර 2022 මැයි 02 දින වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම.





- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ මඩකලපුව ශාඛාව 2022.07.07 දින වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම





- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ කිලිනොච්චි ශාඛාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළම ගොඩනැගිල්ලක නවීකරණ කටයුතු සිදු කර 2022.08.02 දින ස්ථාපිත කිරීම.





- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ මාතර ශාඛාව 2022.09.02 දින වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම.





- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වවුනියාව ශාඛාව වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළම ගොඩනැගිල්ලක ස්ථාපනය කිරීම සඳහා නවීකරණ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී.




- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ ගාල්ල ශාඛාව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ගිංතොට පිහිටි ඩිපෝ පරිශ්‍රයේ ගොඩනැගිල්ලක ස්ථාපනය කිරීම සඳහා ඊට අදාළ නවීකරණ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී.




- නුගේගොඩ ප්‍රධාන කාර්යාලයේ දැනට පවතින රියදුරු හා ආරක්ෂක විවේකාගාර ගොඩනැගිල්ල ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බැවින් මෙම ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී.




- පැමිණෙන සේවාලාභීන් හට වඩාත් කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් සැපයීමේ අරමුණෙන් පහත සඳහන් කාර්යාල සඳහා පුටු මිලදී ගැනීම.

ශාඛාව	පුටු මිලදීගත් ප්‍රමාණය
නුවරඑළිය	25
මඩකලපුව	25
රත්නපුරය	30
මාතලේ	13
පොළොන්නරුව	50
කුරුණෑගල	25
ත්‍රිකුණාමලය	25
මාතර	50
කළුතර	60
වේරහැර	15





ජංගම සේවාවන් ක්‍රියාත්මක කිරීම.

- දකුණු පළාතේ දෙණියාය මැතිවරණ බලප්‍රදේශයේ ප්‍රාදේශීය ජංගම වැඩසටහන සඳහා 2022 මාර්තු මස 19 හා 20 යන දෙදින තුළ ක්‍රියාත්මක විය. මෙහිදී සේවාලාභීන් 612 ක් හට වෛද්‍ය සහතික ලබා දෙන ලදී. උපයන ලද ආදායම රු. 489,600 කි.



- ශ්‍රී ලංකා යුධ හමුදා විද්‍යා පීඨය, දියතලාව නිලධාරීන් 250ක ප්‍රමාණයක් සඳහා 2022.06.26 දින නව රියදුරු බලපත්‍ර ලබා ගැනීම හා සංශෝධනය කිරීම සඳහා වෛද්‍ය සහතික ලබා දීමේ ජංගම වෛද්‍ය කඳවුරක් පැවැත්වීම.





- 2022.11.17 දින මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11ක් ආවරණය වන පරිදි මාතලේ දිස්ත්‍රික්කය තුළ පැවති ජංගම සේවය මාතලේ ශාඛාව තුළ පැවැත්වීම.

- උතුරු පළාත ආවරණය වන පරිදි 2022 ඔක්තෝබර් මස 22 සහ 23යන දෙදින ජංගම සේවා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

- මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අඩු පහසුකම් සහිත කැටැන්විල සමෘද්ධි කලාපයේ ගම්මාන 15ක් කේන්ද්‍ර කරගනිමින් 2022 දෙසැම්බර් මස 11 දින මාර/ මගිදුව කනිෂ්ඨ විද්‍යාලයේදී ජංගම සේවා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.





කාර්යය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කොට ධනාත්මක ආකල්ප ඇති කිරීම.

ආයතනික පිරිස් බල තක්සේරුවට අනුව පුරප්පාඩුව පැවති කාර්යය මණ්ඩල බඳවා ගැනීමට කටයුතු කර ඇත.


නව පත්වීම් (2022.03.15 දිනට)	
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)	01
අභ්‍යන්තර විගණක	01
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්/ නීති නිලධාරී	01

2022 වසර තුළ සිදුකරන ලද වෙනත් කාර්යයන්

- **ශාඛා කාර්යාල සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර සවි කිරීම.**

  සේවක මහත්ම මහත්මීන් නියමිත වේලාවට සේවයට වාර්තා කිරීම අත්‍යාවශ්‍ය බැවින් සේවාලාභීන් හට කාර්යක්ෂම හා තෘප්තිමත් සේවාවක් සැළසීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර නවීකරණය හා යාවත්කාලීන කිරීම.

- **මෙතෙක් ආයතනය තුළ භාවිතා වූ වෛද්‍ය පෝරමය යාවත්කාලීන කිරීම.**


Serial No. DMT/LV/12/ NTMI No: M.C.Type: LIGHT VEHICLE

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

தேசிய போக்குவரத்து மைத்திய நிறுவகம்

NATIONAL TRANSPORT MEDICAL INSTITUTE

Ministry of Vehicle Regulation, Bus Transport Services and Train Compartments and Motor Car Industry

Medical Examination Report

Date of Examination:

NIC No: Passport No: License No:

Full Name:

Address:

Sex: Date of Birth: Age:

Declaration of Applicant;

A. PHYSICAL EXAMINATION

[I] General Examination :

a) Height : Ft Inches cm BMI Weight : Kg.

b) Any skeletal / limb deformities : Present Absent

c) Partial or complete amputation of finger or limbs

Remarks :

d) VISION

Vision		Corrected Vision			
		Date Visited			
Right	6/	Right	6/	6/	6/
Left	6/	Left	6/	6/	6/

Vision Corrected by Squint

Spectacle

Contact Lenses

e) HEARING : Satisfactory Unsatisfactory Satisfactory with the aid

[II] Cardiovascular System :

a) Pulse : /min Regular Irregular


b) Blood pressure : mm. Hg

c) Heart murmurs : Present Absent

[III] Respiratory System : Any lung disease : Present Absent

[IV] Central Nervous System : Normal [V] Psychological status : Stable

NTMI


B. SPECIAL LABORATORY INVESTIGATIONS

a) mg/dl b) Blood group

c) Chest Xray / ECG :

REFERRAL BY MO (if necessary)

C. Recommendations of the Consultant / Technical Assessor (if any)

D. RECOMMENDATION OF THE MEDICAL OFFICER

I have medically examined Mr./Ms./Dr.

and certify that he/she is physically and mentally fit/unfit for driving of following category/s of vehicles on public highways.

						Recommended Number of Vehicle Categories
Motor cycles	A	All cars/dual purpose	B	Land vehicles	G	6
Light motor cycles	A1	Tricycles/tricycle vans	B1	Hand tractors	G1	

SPECIAL CONDITIONS :

- Must wear the spectacles/Contact Lenses while driving
- Must wear the hearing aid while driving
- Periodic Medical Examination required : (please make a note under the remarks)
- Regular treatment required :

Remarks if any :

Medical Officer

Name & Stamp of the Medical Officer

Date of Issue :

- **වෛද්‍ය සේවා ගාස්තු සංශෝධනය කිරීම.**

  රට තුළ පවතින තත්ත්වය අනුව ආයතනයේ මූල්‍ය තත්ත්වය ස්ථාවරව පවත්වා ගෙන යෑම සඳහා වසර දහයකට පසු එනම් 2022.08.08 දින සිට වෛද්‍ය සේවා ගාස්තු සංශෝධනය කිරීම.

- **කාර්යය පටිපාටිය සංග්‍රයක් සකස් කිරීම.**

  ආයතන ධූරාවලියේ ඉහළ කළමනාකාරිත්ව මට්ටමේ සිට පහළ කළමණාකාරිත්ව මට්ටම දක්වා වූ ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛා කාර්යාලවල සියලුම කාර්යය මණ්ඩල සාමාජිකයන් වෙත ආයතනයේ ක්‍රියාපටිපාටිය පිළිබඳව මඟ පෙන්වීමක් මෙමඟින් ලබා දී ඇත.

- **සේවක මහත්ම මහත්මීන් හට ස්ථාන මාරුවීම් ලබා දීම.**

  මේ යටතේ සේවක ඉල්ලීම් සළකා බලා ආයතනයේ බොහෝ සේවක පිරිසකට ඔවුන්ගේ පදිංචිය ආසන්න ශාඛා කාර්යාල වෙත ස්ථාන මාරුවීම් ලබා දීම.

- **සේවක ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

  ආයතනයේ සේවක මහත්ම මහත්මින් පුහුණු වැඩසටහන් සඳහා යොමු කර ආයතනයේ මානව සම්පත් සංවර්ධනය තුළින් සේවාලාභියා තෘප්තිමත් කරගත් ගුණාත්මක සේවාවක් සැපයීම.

අභියෝග හා ගැටලු

I. **ශාඛා කාර්යාල සඳහා ස්ථිර ගොඩනැගිලි ඉදි කිරීම.**

ශාඛා කාර්යාල බොහෝමයක් පවත්වනු ලබන්නේ කුලී පදනම මත ලබාගෙන ඇති පෞද්ගලික හෝ රජයේ ගොඩනැගිලිවලය. ඒ සඳහා මසකට රුපියල් විසි ලක්ෂයකට ආසන්න මුදලක් වැය වේ. එය වසරකට රුපියල් ලක්ෂ 240කට ආසන්න අගයක් වන අතර එම අගය ඉදිරියේදී තවත් ඉහළ යනු ඇත.

II. **විදුලි උත්පාදක යන්ත්‍ර මිලදී ගැනීම.**

ශාඛා බොහෝමයක් සඳහා විදුලි උත්පාදක යන්ත්‍ර ලබා දී නොමැත. විවිධ හේතු නිසා විදුලි උත්පාදක යන්ත්‍ර මිලදී ගැනීමට හැකි වූයේ නැත. ඉදිරියේදී මේ පිළිබඳ අවශ්‍ය කටයුතු සිදුකළ යුතුව ඇත.

III. **ආයතනය සඳහා ස්ථිර වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීමේ අපහසුතාවය.**

ස්ථිර වෛද්‍ය නිලධාරි මූලික වැටුප සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය නිලධාරියකුට සමාන මට්ටමේ පවතින නමුත්, දීමනා අඩු බැවින් මාසික පාරිශ්‍රමිකය ඉතා පහළ මට්ටමක පවති. සීමාවාසික පුහුණුවීම් වසර අවසන් කරන සියලුම වෛද්‍යවරුන්ට සෞඛ්‍ය අමාත්‍යාංශයේ පත්වීම් ලැබෙන බැවින් එම නිලධාරීන්ට ලැබෙන වැටුපට වඩා ආකර්ෂණීය වන වැටුපක් අප ආයතනයේ නිලධාරීන්ට නොලැබෙන බැවින් වෛද්‍යවරු මෙම ආයතනයේ සේවයට බැඳීමට මැලි බවක් දක්වයි. තවද, වෘත්තීයේ ඇති ඒකාකාරී බවද වෛද්‍යවරුන්ට ඇති අභියෝගයක් වන අතර උසස් අධ්‍යාපනයට සීමාවන් තිබීම නිසා සීමාවාසික පුහුණුවීම් අවසන් වූ වෛද්‍ය නිලධාරීන් මෙම ආයතනයට යොමුවීමට අකමැති බවක් දක්වයි.

IV. **සේවක වැටුප් සංශෝධනය කිරීම සම්බන්ධ ගැටලු.**

කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව මඟින් වැටුප් හා විශේෂ දීමනා සඳහා අනුමැතිය ලබා ගැනීමේ අපහසුතාවය නිසා සේවක ප්‍රතිලාභ වැඩි කිරීම සම්බන්ධයෙන් ගැටලු මතුවී ඇත. අනෙකුත් රාජ්‍ය ආයතන, සංස්ථා හා මණ්ඩල අනුව ලාභ ලබන්නා වූ ආයතනයක් වූවත් මෙම ආයතනයේ නිලධාරීන්ගේ හා සේවකයන්ගේ වැටුප් හා ප්‍රතිලාභ එතරම් ආකර්ෂණීය නොවන බැවින් ඒ පිළිබඳව කටයුතු සිදුකළ යුතුව ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } සීඕවී/ඩී/එන්ටීඑමඅයි/එප්ජ්/01/2022/13

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2023 මැයි 31 දින

NATIONAL TRANSPORT MEDICAL INSTITUTE
01 JUN 2023
CHAIRMAN OFFICE

සභාපති,

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය.

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති.

පිටපත:- 1. ලේකම් - ප්‍රවාහන් අමාත්‍යාංශය

2. ලේකම් - මුදල් අමාත්‍යාංශය

Director
F.Y.N.A
02/06/23

Accountant / R&D officer
F.Y.N.A
02/6/2023

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. සිඔවි/ඩී/එන්ටීපීඑම්අයි/එෆ්ඒ/01/2022/13 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2023 මැයි 29 දින

සභාපති,

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 4 8වගන්තිය ප්‍රකාරව වත්කම් හා වගකීම් එකිනෙකට හිලව්කර මූල්‍ය ප්‍රකාශනවල නොදැක්විය යුතු වුවද, බැංකු ශේෂයන්ට අදාල රු .13,883,34 7ක හර හා බැරශේෂයන් එකිනෙකට හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම රු .6,981,370 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධනිත කරන ලද රු. 10,843,201 ක ගොඩනැගිලි වලට අදාලව රු. 271,080 ක ක්ෂය වෙනුවෙන් ප්‍රතිපාදන ගිණුම් වල සලසා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු. 9,190,238 ක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙන් ලැබිය යුතු ලෙස දක්වා තිබුණද, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වල ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයට ගෙවියයුතු ලෙස අදාල ශේෂය දක්වා නොතිබුණි .

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමය.

ආයතනයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලකමණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 1971 අංක 38 දරන මුදල් පනත 11 වන වගන්තිය	ආයතනය විසින් මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව රු.1,513,150,579 ක මුදලක් ස්ථාවර තැන්පතු හා භාණ්ඩාර බිල්පත් වල ආයෝජනය කර තිබුණි.

(ආ)	මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද අංක 03/ 2022 දරන 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය	රාජ්‍ය වියදම් පාලනය කිරීමට යටත්ව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් යටතේ මාණ්ඩලික නිලධාරීන් වෙත ලබාදෙනු ලබන ණය පහසුකම් 2022 වසර අවසන් වන තෙක් අත්හිටුවන ලෙස දක්වා තිබුණද එයට පටහැනිව ආයතනයේ මාණ්ඩලික නිලධාරීන් සඳහා 2022 වර්ෂය තුල රු. 464,328 ක ආපදා ණය මුදල් ගෙවා තිබුණි.
(ඇ)	අංක 21/ 2015හා 2015 අගෝස්තු 19දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ සංශෝධිත 13. 2 හා 13. 5උප වගන්ති	නිලධාරියාගේ කැමැත්ත පරිදි ඕනෑම එක් වාර්ෂික උත්සවයක් සඳහා රු .10,000 බැගින් අත්තිකාරම් මුදලක් ලබාදිය හැකි වුවත් වෛද්‍ය ආයතනයේ සේවකයන් 228 ක් වෙනුවෙන් එම සීමාව ඉක්මවා රු .30, 000බැගින් උත්සව අත්තිකාරම් ගෙවා තිබුණි.
(ඈ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 5.4.8 වගන්තිය	ආයතනයේ කටයුතු සඳහා අවශ්‍ය රු.31,415,000 ක සැහැල්ලු හා බර වාහන වෛද්‍ය පෝරම් ලබාගැනීමේදී සියයට 10 ක කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂයේ දී රු.33,499,620 ක මුදලක් සියයට 5 ක් 12 ක් වන පොළී අනුපාත යටතේ ස්ථාවර තැන්පතු වල හා රු.35,000,000 ක් සියයට 9.85 ක පොළී අනුපාතිකයක් යටතේ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණු අතර පවතින වෙළඳපොළ

වාතාවරණය තුළ ඒ සඳහා වැඩි පොළී අනුපාතිකයක් සහිත ආයෝජනයන් සිදු කිරීමට කළමණාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) ආයතනයේ කටයුතු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් වෛද්‍යවරුන් 75 දෙනෙකු අනුමත කර තිබුණද, ස්ථිර වශයෙන් බඳවාගෙන වෛද්‍යවරුන් 10 දෙනෙකු පමණක් බඳවාගෙන තිබූ අතර ශාඛා කාර්යාල 20 ක් සඳහා ස්ථිර පදනමින් එක් වෛද්‍යවරයෙකු හෝ බඳවා නොගෙන කොන්ත්‍රාත් පදනම මත වෛද්‍යවරුන් 37 දෙනෙකු හා අර්ධකාලීන වශයෙන් (Part time) වෛද්‍යවරුන් 98 දෙනෙකු සේවයට බඳවාගෙන තිබුණි.

(ඇ) ආයතනයේ ශාඛා කාර්යාල පිහිටුවීම සඳහා රජයේ ගොඩනැගිලි යොදා ගැනීමට හෝ ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීමට කටයුතු නොකර කුලී පදනම මත ලබාගෙන් තිබූ පෞද්ගලික අංශයේ ගොඩනැගිලි සඳහා සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි කුලී වශයෙන් රු. 31,437,501 ක් ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

විගණන විමසුම සඳහා පිළිතුරු

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1.2 **තත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) 2022/12/31 දින 228044 ගිණුමට අදාළ ශේෂය රු. 1,840,780.73 කි. මුදල් පොත තුළ රු. 13,883,347ක ශේෂයක් පැවතියද කිසිසේත්ම බැංකු ජංගම ගිණුමේ අයිරා ශේෂයක් පවත්වා නොගනී. අප ආයතනය විසින් මෙතෙක් අයිරා පහසුකමක් ලබා ගෙන නොමැති අතර, අයිරා පොලියක්ද ගෙවා නොමැත. ජංගම ගිණුම තුළ වැඩිපුර මුදල් තබා ගැනීම කිසිසේත්ම ප්‍රායෝගික නොවන අතර එම අතිරික්ත මුදල් කෙටිකාලීන අයෝජන වන Repo වල ආයෝජනය කර පොලියක් ලබා ගනී. චෙක්පත් ආයතනයෙන් නිකුත් කළ පසු පමණක් බැංකු ගිණුම් ශේෂය පවත්වා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ) ලංකා බැංකුවේ ඇති ස්ථාවර තැන්පතු දෙකක (02) ආයෝජිත දිනය ලෙස අප ආයතනයේ ඇති ලේඛනයේ දක්වා ඇත්තේ 2022.08.27 දිනය වුවත් ස්ථාවර තැන්පතුවේ සඳහන්ව ඇත්තේ 2022.10.27 වේ. එමනිසා ලැබිය යුතු පොළී මුදල ගණනය කිරීමේදී දින 60ක වැඩිපුර පොළියක් ගණනය කර වර්ෂයේ ලැබිය යුතු පොළිය ලෙස සටහන් කර වර්ෂයට අදාළ ලාභයට ද ගළපා ඇත.

නමුත්, 2023.08.27 දින මෙම ස්ථාවර තැන්පතුව කල්පිරෙන දිනය වන නිසා සත්‍ය පොළිය 2023 වසරේ ලාභයට ගැළපීම සිදුකිරීමට කටයුතු කරමි. එවිට 2022 වර්ෂයේ වැඩි වූ ලාභය 2023 වසරේදී සත්‍ය ලාභයට ගළපන බැවින් 2023 වසරේ අග සමුච්චිත ලාභය නිවැරදිව ගණනය කිරීමට කටයුතු කරමි.

(ඇ) රු. 10,843,201ක ගොඩනැගිලි වටිනාකම ගොඩනැගිලි ගිණුමට හර කර ඇති නමුත්, ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් වී නොමැත. එම නිසා රු.271,080ක ක්ෂය ප්‍රමාණය ගිණුම් ගත වී නොමැත. එම ගැළපීම 2023 වර්ෂයේ සමුච්චිත ලාභයට හා සමුච්චිත ක්ෂය වෙන් කිරීමට ගැළපීමට කටයුතු කරමි.

(ඉ) වසර 2 සිට 5 කාලය තුළ ලැබිය යුතු ගිණුම රු. 3,395,903 මුදලින් රු. 3,000,000 ක පමණ ප්‍රමාණයක් මේ වන විට අයකර ගෙන ඇත.

නමුත් වසර 5ට අධික කාලයක සිට පැවත එන රු. 9,190,238ක ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයෙන් අය විය යුතු මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් පහත නිලධාරි මණ්ඩලයෙන් යුත් කමිටුවක් පත්කර ඇති අතර මෙම කමිටුවේ සාකච්ඡාවන් මේ වන විට පවත්වාගෙන යමින් පවතී.

කමිටු සාමාජිකයින්

1)	ටී.ජී. ලක්ෂ්මන් මහතා, අධ්‍යක්ෂ (පරිපාලන/මූල්‍ය) ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය	-	කමිටු සභාපති
2)	පී.කේ.ඩී.එම්. ගුණසේන මහතා, ප්‍රධාන අභ්‍යන්තර විගණක ප්‍රවාහන අමාත්‍යාංශය	-	සාමාජික
3)	එස්.පී.ඒ.එස්. දිසානායක මහතා, ගණකාධිකාරි ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය	-	සාමාජික
4)	එල්.එම්. ජයලත් මහතා, අභ්‍යන්තර විගණක ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය	-	සාමාජික

5) එච්.එම්. චන්දන කුමාර හේරත් මහතා, ප්‍රධාන මූල්‍ය කළමනාකාර - සාමාජික
ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය

** **ඉදිරියේදී මෙම ලැබිය යුතු මුදල නිරාකරණය කර ගැනීමට කටයුතු සිදුකරමින් පවතී.**

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2

(අ) මෙම රු. 1,513,150,579ක ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර ඇති මුදල වසර ගණනාවක සිට පැවත එන ඒවා වේ. මෙය නව ආයෝජනයක් නොවේ. ඉදිරියේදී ආයෝජනය කිරීමට බලාපොරොත්තු වන ආයෝජනයන් සඳහා අනුමැතිය ලබාගැනීමට බලාපොරොත්තු වේ. කෙසේ නමුත් ආයතනයේ අතිරික්ත මුදල් ආයෝජනය කරනු ලබන්නේ ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන රජයේ බැංකුවල පමණි. මෙම ආයෝජනයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමිව ඇත.

(ආ) ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය යනු මහාභාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබානොගන්නා ආදායම ස්වයංව උත්පාදනය කරගන්නා ආයතනයකි. එබැවින් මේ වන විට පවතින ආර්ථික තත්වය හේතුවෙන් මාසිකව 4% පොළිය සමඟ වාරික මුදල් අයකරගැනීමේ පදනම මත මුදල් සුළු ප්‍රමාණයක් ආපදා ණය මුදල් ලෙස ලබා දී ඇත. තවද, 2023 වර්ෂයේ සිට නිවැරදි කිරීමට පියවර ගෙන ඇත.

(ඇ) ඉතා දීර්ඝ කාලයක සිට මෙම උත්සව අත්තිකාරම් මුදල් සේවකයන්ට ලබා දෙන බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ආයතනයේ සේවකයන් හට මෙම උත්සව අත්තිකාරම් මුදල ගෙවීම් කරන ලදි.

(ඈ) මේ වන විට ගිවිසුම අවසන් වන දිනය දක්වා එනම් 2023.08.06 දිනය දක්වා කාර්යය සාධන සුරක්ෂණයක් ලබාගෙන තිබේ.

2.3 වෙනත් කරුණු

(අ) භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ මුදල් සෑම විටම මුදල් කර ගැනීමට නොහැක. එසේම ඒවා කල් පිරීමට පෙර මුදල් කර ගන්නේ නම් අදාළ නිසි පොළී ආදායම ආයතනයට හිමි නොවේ. කල්පිරුණු සියළුම ස්ථාවර තැන්පතු මිලියන 140 ට 20% කට වඩා වැඩි පොලී අනුපාතය යටතේ අයෝජනය කර ඇත. මෙම රු. 33,499,620 හා රු. 35,000,000 යන මුදල් කල්පිරුණු පසු මේ වන විට ඉහළම පොලී අනුපාත යටතේ ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඇත.

(ආ) ආයතනය තුළ ස්ථීර වෛද්‍ය නිලධාරීන් සිටිනුයේ සුළු ප්‍රමාණයකි. ස්ථීර වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීමට දීර්ඝ කාලයක සිට පුවත්පත් දැන්වීම් පළකරමින් උත්සාහ කළද, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ වැටුප් හා දීමනා මත අපගේ ආයතනයෙන් වෛද්‍ය නිලධාරීන්ට ගෙවනු ලබන දීමනා අඩු බැවින් ස්ථීර පදනම මත වෛද්‍ය නිලධාරීන් ආයතනයේ සේවයට පැමිණීමට අකමැත්තක් දක්වයි. එබැවින් කොන්ත්‍රාත් පදනම මත හා දෛනික පැය පදනම මත වෛද්‍ය නිලධාරීන් බඳවා ගෙන සේවාලාභීන් අපහසුතාවයට පත් නොවන පරිදි සේවය අඛණ්ඩව පවත්වා ගෙන යනු ලබයි.

(ඇ) ආයතනය සඳහා ගොඩනැගිලි ලබා ගැනීමේදී රජයේ ගොඩනැගිලි ලබා ගැනීම සඳහා විමසීම් කර සියලුම අදිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලිපි ඉදිරිපත් කළ අතර, එහිදී ඔවුන්ගේ දිස්ත්‍රික්කයන්වල ඉඩම් හෝ ගොඩනැගිලි නොමැති බවට බොහෝ දිස්ත්‍රික් ලේකම්වරු දන්වා ඇත. යම් අවස්ථාවන්වල රජයේ ගොඩනැගිලි පවතින බවට හඳුනාගත්තද එම ගොඩනැගිලි අපට අවශ්‍ය ආකාරයට සකස් කර ගැනීමට නොහැක. රාජ්‍ය වියදම් චක්‍රලේඛය ප්‍රකාරව නව ගොඩනැගිලි වෙනුවට දැනට පවත්වාගෙන යනු ලබන ගොඩනැගිලිවලම ශාඛා කාර්යාල පවත්වා ගෙන යනු ලබයි. ඉදිරියේදී රජයේ ගොඩනැගිලි ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

2022 වර්ෂයේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අනුගමනය කල ක්‍රියාමාර්ග

- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ කළුතර ශාඛාව 2022.03.15 දින වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම.
- මාසික කුලී පදනම මත තෝරා ගත් ත්‍රිකුණාමලය ශාඛා කාර්යාලයේ අභ්‍යන්තර ව්‍යුහය වෙනස් කර නවීකරණ කටයුතු සිදු කර 2022 මැයි 02 දින වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම.
- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ මඩකලපුව ශාඛාව 2022.07.07 දින වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම
- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ කිලිනොච්චි ශාඛාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළම ගොඩනැගිල්ලක නවීකරණ කටයුතු සිදු කර 2022.08.02 දින ස්ථාපිත කිරීම.
- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ මාතර ශාඛාව 2022.09.02 දින වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම.
- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වවුනියාව ශාඛාව වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළම ගොඩනැගිල්ලක ස්ථාපනය කිරීම සඳහා නවීකරණ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී.
- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ ගාල්ල ශාඛාව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ගිංතොට පිහිටි ඩිපෝ පරිශ්‍රයේ ගොඩනැගිල්ලක ස්ථාපනය කිරීම සඳහා ඊට අදාළ නවීකරණ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී.
- නුගේගොඩ ප්‍රධාන කාර්යාලයේ දැනට පවතින රියදුරු හා ආරක්ෂක විවේකාගාර ගොඩනැගිල්ල ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බැවින් මෙම ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී.
- පැමිණෙන සේවාලාභීන් හට වඩාත් කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් සැපයීමේ අරමුණෙන් ශාඛා කාර්යාල සඳහා ගැන් පුටු මිලදී ගැනීම.
- ආයතනික පිරිස් බල තක්සේරුවට අනුව පුරප්පාඩුව පැවති කාර්යය මණ්ඩල බඳවා ගැනීමට කටයුතු කර ඇත.
- ශාඛා කාර්යාල සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර සවි කිරීම.
- මෙතෙක් ආයතනය තුළ භාවිතා වූ වෛද්‍ය පෝරමය යාවත්කාලීන කිරීම.
- වෛද්‍ය සේවා ගාස්තු සංශෝධනය කිරීම.
- කාර්යය පටිපාටිය සංග්‍රයක් සකස් කිරීම.
- සේවක ඉල්ලීම් සළකා බලා ආයතනයේ බොහෝ සේවක පිරිසකට ඔවුන්ගේ පදිංචිය ආසන්න ශාඛා කාර්යාල වෙත ස්ථාන මාරුවීම් ලබා දීම.
- සේවක ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

වත්කම්	සටහන් අංක	2022 රු. ශත	2021 රු. ශත
ජංගම නොවන වත්කම්			
ස්ථාවර වත්කම් හා උපකරණ	4	254,842,153,.04	249,462,916.83
නොනිමි වැඩ - ඉදිකිරීම්		14,520,433.73	13,135,716.63
ආයෝජන	5	1,432,374,227.03	1,423,839,447.56
ආයෝජන - පාරිතෝෂික අරමුදල	6	80,776,352.46	84,310,436.75
එකතුව - ජංගම නොවන වත්කම්		1,782,513,166.26	1,770,748,517.77
ජංගම වත්කම්			
තොගය	7	38,179,067.12	47,190,671.74
ලැබිය යුතු ගිණුම්	8	14,821,254.08	14,607,305.96
වෙනත් ලැබිය යුතු	9	239,921,144.18	106,627,775.72
මුදල් සහ මුදල් සමාන වත්කම්	10	3,201,050.85	4,384,466.00
ජංගම වත්කම් එකතුව		296,122,516.23	172,810,219.42
		2,078,635,682.49	1,943,558,737.19
ස්කන්ධ හා වගකීම්			
ප්‍රාග්ධනය		62,099,697.33	62,099,697.33
ප්‍රාග්ධනය හා සංචිතය		22,682,287.89	22,682,287.89
පොදු සංචිතය		1,804,071,674.53	1,666,741,187.57
මුළු හිමිකම		1,888,853,659.75	1,751,523,172.79
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික වෙන්කිරීම්	11	117,041,805.00	110,136,981.25
ගෙවිය යුතු විශ්වාස රක්ෂණ ඇප	11	114,976.26	114,976.26
		117,156,781.26	110,251,957.51
ජංගම වගකීම්			
ගෙවිය යුතු ගිණුම්	12	42,196,907.12	47,618,249.48
උපචිත වියදම්	13	14,573,516.33	15,513,165.84
අනෙකුත් ගෙවිය යුතු	14	15,854,818.03	18,652,191.57
		72,625,241.48	81,783,606.89
වත්කම් හා වගකීම් එකතුව		2,078,635,682.49	1,943,558,737.19

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව සිදු කර ඇති බව සහතික වෙමි.

ගණකාධිකාරී

T. G. Lakshman
Director (Admin / Finance)
National Transport Medical Institute
170, High Level Road,
Nugegoda

අධ්‍යක්ෂක (පාලන/මූල්‍ය)

මූල්‍ය ප්‍රකාශනයේ පිටු අංක 32 සිට 33 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 34 සිට 47 දක්වා ගිණුම්කරණ සටහන් ද අන්තර්ගත වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂක මණ්ඩලයේ වගකීම වන අතර අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ :

J. A. D. B. Abeyrathna
Chairman
National Transport Medical Institute
No. 170, High Level Road,
Nugegoda.
Chairman / CEO

අධ්‍යක්ෂක (අධ්‍යක්ෂක මණ්ඩල)

Nilan Miranda
Director General
National Transport Commission
Board of Director

අධ්‍යක්ෂක (අධ්‍යක්ෂක මණ්ඩල)

මූල්‍ය කාර්යසාධන වාර්තාව
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	2022 රු. ශත	2021 රු. ශත
ආදායම			
ප්‍රධාන වෛද්‍ය සේවා ආදායම්	15	982,257,989.00	635,658,510.00
ඖෂධාගාර ලාභය	23	81,703.41	(374,188.12)
ණය පොළී ආදායම	17	1,830,408.78	1,156,792.95
ස්ථාවර තැන්පතු හා භා.බි. පොලී ආදායම	18	200,095,080.77	80,261,798.55
වෙනත් ආදායම්	19	439,667.94	447,676.43
මුළු ආදායම		1,184,704,849.90	717,150,589.81
වියදම්			
පරිපාලන වියදම්	20	436,779,784.63	369,707,703.01
ආයතනික වියදම්	21	311,444,915.91	212,363,712.35
වෙනත් වියදම්	22	13,568,667.86	11,536,688.30
මුළු වියදම		761,793,368.40	593,608,103.66
ශුද්ධ ලාභය		422,911,481.50	123,542,486.15

** මූල්‍ය ප්‍රකාශනයේ පිටු අංක 32 සිට 47 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් අන්තර්ගත වේ.

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය

	ප්‍රාග්ධනය	පොදු සංචිතය	සමුච්චිත ලාභය/ අලාභය	එකතුව
2021 වර්ෂයේ ජනවාරි 01 දිනට ශේෂය	62,099,697.33	22,682,287.89	1,653,198,701.42	1,737,980,686.64
2021 වර්ෂයේ ශුද්ධ ලාභය			123,542,486.15	123,542,486.15
භාණ්ඩාගාර ඒකාබද්ධ අරමුදලට දායකත්වය			(110,000,000.00)	(110,000,000.00)
2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය	62,099,697.33	22,682,287.89	1,666,741,187.57	1,751,523,172.79
2022 වර්ෂයේ ජනවාරි 01 දිනට ශේෂය	62,099,697.33	22,682,287.89	1,666,741,187.57	1,751,523,172.79
පෙර වර්ෂයේ ගැලපීම			4,419,005.46	4,419,005.46
2022 වර්ෂයේ ශුද්ධ ලාභය	-	-	422,911,481.50	422,911,481.50
භාණ්ඩාගාර ඒකාබද්ධ අරමුදලට දායකත්වය	-	-	(290,000,000.00)	(290,000,000.00)
2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය	62,099,697.33	22,682,287.89	1,804,071,674.53	1,888,853,659.75

මූල්‍ය ප්‍රකාශනයේ පිටු අංක 32 සිට 47 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් අන්තර්ගත වේ.

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

2022.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2022	2021
	රු. ශත	රු. ශත
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
සාමාන්‍ය මෙහෙයුම් අතිරික්තය	422,911,481.50	123,542,486.15
ක්ෂය ගැලපීම්	34,906,687.66	28,326,923.65
පාරිතෝෂික වෙන්කිරීම්	10,375,166.25	9,062,721.00
ආයෝජන පොළී	(200,095,080.77)	(80,261,798.55)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	268,098,254.64	80,670,332.25
තොග වැඩි වීම	9,011,604.62	(28,147,791.04)
ලැබිය යුතු ගිණුම් වැඩි වීම	(213,948.12)	(1,230,922.27)
අනිකුත් ලැබීම් වැඩි වීම/අඩු වීම	(133,293,368.46)	(611,881.40)
ගෙවිය යුතු ගිණුම් වැඩි වීම	(5,421,342.36)	16,767,591.52
උපචිත වියදම් වැඩි වීම/අඩු වීම	(939,649.51)	(2,055,916.52)
අනිකුත් වියදම් වැඩි වීම	(2,797,373.54)	1,166,013.59
මෙහෙයුම් කටයුතුවලින් ජනිත වූ මුදල් පුවාහය	134,444,177.27	66,557,426.13
පාරිතෝෂික ගෙවීම්	(3,470,342.50)	(860,430.00)
භාණ්ඩාගාර ඒකාබද්ධ අරමුදලට දායකත්වය	(290,000,000.00)	(110,000,000.00)
